අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක - 28/2022

මගේ අංකය - ED/4/58/16/08/03(VOL-11)
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
බත්තරමුල්ල

2022.09. 07

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්,
විභාග කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථානමාරු පටිපාටිය - 2022/2023

## ( I , II හා III ශ්‍රේණි)

**1. හැඳින්වීම**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009/02/20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XV111 වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සියළුම නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**(අ) වාර්ෂික ස්ථාන මාරු කමිටුව මගින්**

ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධරයන්ගේ ඉල්ලීම ඉටුකිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ හැරුණු විට අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ විෂයය පථය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන ක්ෂේත්‍රයේ පරිපාලනමය හා කළමනාකරණ අවශ්‍යතාවලට ගැළපෙන ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිව සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරියෙකු වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමද වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල මගින් ක්‍රියාත්මක කෙරේ. මෙම ස්ථාන මාරුවීම් 2023 වර්ෂයේ මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වේ.

**(ආ) වාර්ෂික නොවන ස්ථාන මාරු**

වාර්ෂික ස්ථාන මාරු කමිටුවලදී හැර දෛනිකව සිදු කෙරෙන කාර්යයක් ලෙස ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථාන මාරුවීම් සිදු නොකෙරේ. එහෙත් පරිපාලනමය අවශ්‍යතා සහ විනය හේතු මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් ලබා දෙනු ලබන ස්ථාන මාරු නියෝගවලට නිලධාරීන් යටත්වේ. නිලධාරීන්ගේ සුහද ස්ථාන මාරු ඉල්ලීම් ද, නිලධාරීන්ගේ සානුකම්පිත ඉල්ලීම් ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිරීක්ෂණ / නිර්දේශ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## 2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර

2.1 දැනට සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1,11 සහ111 ශ්‍රේණියේ සියලුම නිලධාරීන් (විදුහල්පතිවරු, නියෝජ්‍ය විදුහල්පතිවරු සහ පළාත් සභාවල සේවය සඳහා මුදාහැර ඇති නිලධාරීන් ද ඇතුළත්ව) අතුරින් වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත්වන නිලධරයන්

2.1.1. අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් (මධ්‍යම රජයේ) යම් සේවා ස්ථානයක අඛණ්ඩව වසර 06ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම නිලධරයන්

2.1.2. යම් පළාත් සභාවකට අයත් සේවා ස්ථානයක /ස්ථානවල (පළාත්, කලාප ,කොට්ඨාස අධ්‍යාපන කාර්යාල හා පළාත් පාසල්) ඛණ්ඩව හෝ අඛණ්ඩව වසර 12 ක්-හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම නිලධරයන්

2.1.3. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කර ඇති නමුත් මෙතෙක් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II හා III තනතුරුවල සේවය කරන නිලධරයන්

2.2 කිසියම් සේවා ස්ථානයක අවම වශයෙන් වසර 03 ට වැඩි සේවා කාලයක් සේවය කර ඇති නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.3 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත පත් කරනු ලබන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ, ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), විභාග කොමසාරිස්, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්, විදුහල්පති වැනි තනතුරුවලට අදාළව සිදු කරනු ලබන ස්ථාන මාරුවීම් එම තනතුරු සඳහා ස්ථිරව පත් කරන ලද නිලධාරීන් අතර පමණක් සිදු කරනු ලැබේ. තවද, උක්ත තනතුරුවලට ස්ථිරව පත් කරන ලද නිලධාරීන් විශ්‍රාම ගැනීම හෝ වෙනත් හේතු මත එම තනතුරුවල ඇති වන පුරප්පාඩු සඳහා ස්ථාන මාරු පටිපාටිය අනුව ස්ථාන මාරු කිරීම් සිදු නොකරන අතර, සේවා ව්‍යවස්ථානුකූලව එම පුරප්පාඩු සම්පූර්ණ කරනු ඇත.

සටහන :-

i. යම් පළාත් සභාවක් තුළ පිහිටි පළාත්, කලාප, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයක ඛණ්ඩව හෝ අඛණ්ඩව වසර 12 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එසේම එක් සේවා ස්ථානයක අඛණ්ඩව වසර 06 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් පළාත් සභාව තුළ පිහිටි කාර්යාල අතර ස්ථාන මාරු කිරීම පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් හෝ බලධාරියෙකු විසින් සිදු කරනු ලැබේ.

ii. පළාත් සභාවකට තාවකාලිකව මුදාහැර ඇති නිලධරයෙකු අදාල පළාත් සභාවෙන් පිටතට ස්ථාන මාරු කිරීම අදාළ පළාත් ආණ්ඩුකාරවරයාගේ හෝ පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලය පවරනු ලැබූ බලධරයාගේ එකඟතාවය ඇතිව සිදු කරනු ලැබේ.

iii.වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ යම් පළාත් සභාවකට තාවකාලිකව මුදාහරිනු ලබන නිලධාරීන් එම පළාත් සභාව තුළ ස්ථානගත කිරීම පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් හෝ බලධරයකු විසින් සිදු කරනු ලැබේ.

## 3. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පහත නිලධරයන්ගෙන් සමන්විත වාර්ෂික ස්ථාන මාරු කමිටුව පත් කරනු ඇත.

I. අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) - සභාපති
II. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) - සාමාජික
III. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා වෘත්තීය සමිති නියෝජිතයෙක්- සාමාජික

## 4. වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය

I. රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් - සභාපති
II. අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) - සාමාජික
III. අධ්‍යාපන අමාත්‍යාංශයේ හැර වෙනත් අමාත්‍යාංශයක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙක් - සාමාජික

4.1 ස්ථාන මාරු නියෝගයන් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ සමග කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව පිහිටුවිය යුතුය. එමඟින් පහත කරුණු පරීක්ෂා කර තීරණ ලබා දෙනු ඇත.

4.1.1 ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරු කිරීම්
4.1.2 නිලධාරීන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරු කිරීම්
4.1.3 ස්ථාන මාරු අයදුම්කරන ලද දිනෙන් පසුව නිලධාරීන්ට සිදු වූ හදිසි විපත් කරදර අසනීප වැනි සානුකම්පිත තත්ත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇති අවස්ථා

## 5. වාර්ෂික ස්ථාන මාරුවීම් සිදු කිරීමේදී සලකා බැලිය යුතු පොදු කරුණු

5.1 මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී සේවා අවශ්‍යතාවලට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

5.2 වාර්ෂික ස්ථාන මාරුවලදී කාලය ගණනය කරනු ලබන්නේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය. (උදා - 2023 වාර්ෂික ස්ථානමාරු සඳහා 2022.12.31 දින අදාළ වේ)

5.3 ස්ථාන මාරු ඉල්ලුම් කරන හා ස්ථාන මාරුවලට යටත්වන නිලධරයන් තමන් ස්ථාන මාරු වීමට කැමති ස්ථාන තුනක් සඳහන් කරමින් අංක 01 ආකෘතිය පරිදි ස්ථාන මාරුවීම් අයදුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. ස්ථාන මාරුවීම් සඳහා සලකා බලනුයේ අදාළ ආකෘති පත්‍රය අනුව ඉදිරිපත් කරන අයදුම්පත්‍ර පමණි.

5.4 ස්ථාන මාරු අයදුම්පත්‍රයේ සඳහන් සේවා ස්ථානයට මාරුවීම් ලබාදීමට උත්සාහ කරනු ලබන අතර ඉල්ලා ඇති සේවා ස්ථානයට මාරුවීම් ලබා දීමට නොහැකි වූවහොත් සේවා අවශ්‍යතාව අනුව මාරුවීම් මණ්ඩලයේ අභිමතය පරිදි ඔවුන්ට වෙනත් සුදුසු සේවා ස්ථානයක් ලබා දෙනු ඇත.

5.5 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ පළාත් සභාවකට තනතුරක් සඳහා සෘජුවම ස්ථාන මාරු නොකරනු ලබන අතර, ස්ථාන මාරු ලබා දීම සඳහා අදාළ පළාත් සභාව වෙත තාවකාලිකව මුදාහැරීම පමණක් සිදු කරනු ලැබේ. වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ යම් පළාත් සභාවකට තාවකාලිකව මුදාහරිනු ලබන නිලධාරීන් එම පළාත් සභාව තුළ ස්ථානගත කිරීම පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් හෝ බලධරයකු විසින් කරනු ලැබේ.

5.6 ස්ථාන මාරු අයදුම් කර නැතත් 2.1 හි සඳහන් පරිදි අදාළ කාල සීමාව ඉක්මවා ඇති නිලධාරීන්ට ද ස්ථාන මාරු කමිටුවේ අභිමතය පරිදි සේවා අවශ්‍යතාව සලකා ස්ථාන මාරුවීම් ලබා දෙනු ලැබේ. එවැනි ස්ථාන මාරුවීම් ලබා දීමේ දී , එකම සේවා ස්ථානයක වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාගේ සිට සේවා කාලය අවරෝහණ පිළිවෙලින් ගණනය කර, ඒ අනුව ස්ථාන මාරුවීම් ලබා දෙනු ලැබේ.

5.7 නිලධරයාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු ඇත්නම් මිස සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු 58 ක් ඉක්ම වූ නිලධරයන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය. නමුත්, දිස්ත්‍රික්කය ඇතුළත ස්ථාන මාරු කිරීම්වලට යටත් වන්නේය.

5.8 නිලධරයා හා කලත්‍රයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම් එම දෙදෙනාටම ඔවුන්ගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කිරීමට ඉඩ ලබාදීමට මාරු මණ්ඩලය සෑම උත්සාහයක්ම දැරිය යුතුය.

5.9 පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශ ගතව සිටින අවස්ථාවන් වැනි පිළිගත හැකි කරුණු සහිතව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / පාසලේ විදුහල්පතිවරයාගේ නිර්දේශයන් ද සමග ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතුය.

5.10 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හි සඳහන් විධිවිධාන අනුව නිලධරයා සේවයට බැඳුණු භාෂාව නොවන රාජ්‍ය භාෂාවක් පරිපාලන භාෂාව වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක වූ යම් කාර්යාලයක් වෙත නිලධාරියා වාර්ෂික ස්ථාන මාරුවක් ඉල්ලා තිබෙන අවස්ථාවක දී ඊට ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරනු ලැබේ.

5.11 යම් නිලධාරියෙකුගේ කලත්‍රයා පොලිසියේ, ත්‍රිවිධ හමුදාවේ, උතුරු නැගෙනහිර ක්‍රියාත්මක රාජකාරිවලදි ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවට පිළිගත හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන්නේ නම්, නිලධරයන්ගේ ස්ථාන මාරුවීම කළයුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම අනුව පමණි. එසේම එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳ ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ.

5.12 මාරු මණ්ඩලය විසින් නිලධරයන් මාරු කිරීමේ දී අදාළ ආයතනයේ කාර්ය මණ්ඩලයේ කනිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමට ද සැමවිටම උත්සාහ කළ යුතුය.

5.13 වාර්ෂික ස්ථාන මාරු පටිපාටියෙහි 2.2 ඡේදය යටතට ගැනෙන නිලධරයකු වෙනත් ස්ථානයකට මාරුවීම සඳහා ඉල්ලුම් කර ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 2.1.1 /2.1.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති, එම ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට ස්ථාන මාරු කරනු ලැබිය හැකිය.

5.14 නිලධරයකු විසින් කරන ලද ඉල්ලීමකට අනුව ස්ථාන මාරුවක් ලබා දී ඇති විටක, එම නිලධරයා විසින්ම එම ස්ථාන මාරුවීම අවලංගු කර ගැනීම සඳහා ඉල්ලීමක් කොට එය අවලංගු කර ගන්නේ නම් (ඉතාම සාධාරණ ඉල්ලීමකට) ඉදිරි වසර 3ක් දක්වා ඔහුට /ඇයට ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීම සඳහා ඇති හිමිකම සීමාවන නමුත් එම කාලය තුළදී ඉහත 2 ඡේදය යටතේ සඳහන් අවශ්‍යතා සපුරා තිබේ නම් එම නිලධරයා අනෙකුත් නිලධරයන්ට ප්‍රමුඛතාවය ලබා දීමෙන් පසු සුදුසු සේවා ස්ථානයකට ස්ථාන මාරු කරනු ලැබේ.

5.15 අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික පාසල් හා මධ්‍යම රජය යටතේ පවතින ආයතනවල වසර 06 කට වැඩි සේවා කාලයක් සහිත නිලධරයන්ගේ නාම ලේඛනයක්, ඔවුන්ගේ වයස, සේවා කාලය, පදිංචි ප්‍රදේශය, ස්ථාන මාරු කළහොත් මාරු වී යාමට වඩාත් කැමති ස්ථාන 3ක් යනාදී සියලු තොරතුරු ආකෘති පත්‍ර අංක 02 පරිදි නිවැරදිව සම්පූර්ණ කර ( අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වනු ලබන දිනට පෙර) අදාළ ආයතන ප්‍රධානීන් විසින් රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත එවිය යුතුය.

5.16 අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් සියලුම දෙපාර්තමේන්තු, අනෙකුත් ආයතන හා ජාතික පාසල්වල වසර 06 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් පිළිබඳව නිවැරදි හා සම්පූර්ණ තොරතුරු නියමිත පරිදි ඉදිරිපත් කිරීමට ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් වග බලා ගත යුතුය. සාවද්‍ය, අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධරයන් ඒ පිළිබඳ වගකීමට යටත් වේ.

5.17 පළාත් සභාවක් යටතේ අඛණ්ඩව වසර 12 කට වඩා සේවය කළ නිලධරයන්ගේ නාම ලේඛනයක්, ඔවුන්ගේ වයස, සේවා කාලය, පදිංචි ප්‍රදේශය, ස්ථාන මාරු කළහොත් මාරු වී යාමට වඩාත් කැමති ස්ථාන 3ක් යනාදී සියලු තොරතුරු ආකෘති පත්‍ර අංක 03 පරිදී නිවැරදිව සම්පූර්ණ කර පළාත් ආණ්ඩුකාරවරයාගේ හෝ පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලය පවරනු ලැබූ බලධරයාගේ එකඟතාව සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වනු ලබන දිනට පෙර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.

5.18 "2.3" යටතේ සඳහන් කොන්දේසිවලට යටත්ව එක් එක් ශ්‍රේණියට අයත් සියලු තනතුරු අතර නිලධාරීන් ස්ථාන මාරු කළ හැකි අතර ස්ථාන මාරු කරන නිලධාරියාගේ අනුප්‍රාප්තිකයා ලෙස ස්ථාන මාරු කළ යුත්තේ එම නිලධාරියා දරණ තනතුර අනුමත කර ඇති ශ්‍රේණියේ සිටින නිලධාරියකු පමණි.

5.19 යම් පළාත් සභාවකින් පිටතට ස්ථාන මාරු කරනු ලබන නිලධරයන් සංඛ්‍යාවට සමාන නිලධරයන් සංඛ්‍යාවක් එම අදාළ පළාත් සභාව වෙත ස්ථාන මාරු කරනු ලැබේ.

5.20 හැකි සෑම අවස්ථාවකදීම යම් ආයතනයකින් පිටතට මාරු කරනු ලබන නිලධරයන් සංඛ්‍යාවට සමාන නිලධරයන් සංඛ්‍යාවක් එම ආයතනයට ස්ථාන මාරු කරනු ලැබේ.

5.21 යම් සේවා ස්ථානයක වසර 6 කට වඩා වැඩි කාලයක් සේවය කළ නිලධරයෙකු ස්ථාන මාරුවීමක් ඉල්លු විට එම ඉල්ලීම ඉටු කිරීමට මෙහි 5.15 හෝ 5.16 වගන්තියේ අවශ්‍යතා සපුරා ඇති, එකී ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයා ඉන් පිටතට මාරු කළ හැකිය.

5.22 ස්ථාන මාරු මණ්ඩලය මගින් අමාත්‍යාංශයෙන් දෙපාර්තමේන්තුවෙන්/ පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන සේ ඔවුන් මුදා හැරීමට කටයුතු කළ යුතුය (ආකෘති පත්‍ර අංක 07 පරිදී) මෙම විධිවිධානවලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් පිළිබඳ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුය.

5.23 ජාතික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථානමාරු මණ්ඩලය මගින් පළාත් සභාවකින් පිටතට ස්ථාන මාරුවීම ලබා දී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනිමට හැකිවන සේ ඔවුන් පළාත් සභාවෙන් මුදා හැරීමට කටයුතු කිරීම පළාත් බලධාරීන්ගේ වගකීමක් වන්නේය.

5.24 වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව යම් පළාත් සභාවකින් පිටතට ස්ථාන මාරු කරනු ලබන නිලධරයන් එම පළාත් සභාවෙන් නිදහස් කිරීම සඳහා පළාත් ආණ්ඩුකාරවරයාගේ හෝ පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලය පවරනු ලැබූ බලධරයාගේ එකඟතාවය ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට පෙර ලබා ගැනීමට කටයුතු කිරීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ වගකීම වන්නේය.

5.25 ස්ථාන මාරු නියෝගයක් ලැබ සිටින සියලුම නිලධරයන්, නියමිත දිනයේ දී නව රාජකාරි ස්ථානය වෙත වාර්තා කිරීමට බැඳී සිටිති. නිලධරයෙකු වැඩ භාරගැනීමෙන් පසු ඒ බව ආකෘති පත්‍ර අංක 06 ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ලිඛිතව දැන්විය යුතුය.

5.26 ස්ථාන මාරු නියෝග ලැබ සිටින නිලධරයන් නියමිත දිනයෙන් පසුව මුදා නොහැරීම ස්ථාන මාරු විධිවිධානවලට පටහැනිවේ. එබැවින් වාර්ෂික ස්ථාන මාරු නියෝග මත ස්ථාන මාරු ලබා ඇති නිලධාරීන් අනුප්‍රාප්තිකයා පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි ඔවුන් මුදාහැරීමට අදාළ ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය. නිලධාරීන් මුදා නොහරින්නේ නම් තවදුරටත් ඔවුන්ට වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් විසින් වගකීම භාර ගත යුතුය.

5.27 වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු නියෝග ලබා දී ඇති නිලධරයෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවක දී එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති 217 වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

5.28 අමාත්‍යාංශයේ අංශ ප්‍රධානීන් / පළාත් සභාවක / දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ස්ථාන මාරු බලාත්මක වන වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර තම ආයතනයෙන් මුදා හරින ලද / නොලද සේවයට වර්තා කළ / නොකළ නිලධාරීන් පිළිබඳ විස්තර ආකෘති පත්‍ර අංක 08 හා 09 යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුය.

5.29 ස්ථාන මාරුවීම් ලැබේ යැයි අපේක්ෂා කරන නිලධරයන්ගේ රාජකාරි කටයුතු සඳහා කල් ඇතුව වෙනත් නිලධරයන් පුහුණු කර වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානීන් හෝ පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් කටයුතු කළ යුතුය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

5.30 ස්ථාන මාරුවීමට ඉඩ ඇතැයි සිතන කිසියම් නිලධරයකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් තම ආයතනය තුළ රඳවා ගත යුතු යැයි ආයතන ප්‍රධානීන් විසින් අදහස් කරන්නේ නම්, නිර්දේශිත අයදුම්පත්‍ර යොමු කරන අවස්ථාවේදීම එම අවශ්‍යතාව පිළිබඳව පැහැදිලි කර අදාළ නිර්දේශය ද ඇතිව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත තම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව මාරු කමිටුවලට ඒ පිළිබඳ දැනුම් දී ක්‍රියා කරනු ඇත. එක් වතාවක දී මෙම අවස්ථාව ලබා දී ඇති නිලධරයෙකු සඳහා නැවත අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

5.31 වාර්ෂික ස්ථාන මාරු 1 ශ්‍රේණියේ තනතුරක් සඳහා ස්ථාන මාරු ලබන නිලධාරියෙක් අදාළ තනතුරේ වැඩ භාර ගැනීමෙන් පසුව, එම නිලධාරියා අදාළ තනතුරට පත් කිරීමේ ලිපියක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් නිකුත් කරනු ඇත.

6. වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| | කාර්යය | දිනය |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටුවීම | 2022 සැප්තැම්බර් මස 01 දිනට පෙර |
| 02 | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම නිකුත් කිරීම | 2022 සැප්තැම්බර් මස 30 දිනට පෙර |
| 03 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම | 2022 ඔක්තෝබර් මස 31 දිනට පෙර |
| 04 | අදාළ බලධරයා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම | 2022 නොවැම්බර් 20 දිනට පෙර |
| 05 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම | 2022 නොවැම්බර් 30 දිනට පෙර |
| 06 | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව පත් කිරීම. | 2022 දෙසැම්බර් මස 15 දිනට පෙර |
| 07 | ස්ථාන මාරු වීම පිළිබඳ සමාලෝචන කමිටුව සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය | 2022 දෙසැම්බර් මස 31 දිනට පෙර |
| 08 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම. | 2023 ජනවාරි මස 15 දිනට පෙර |
| 09 | අවසාන වාර්ෂික ස්ථාන මාරු වීම් නියෝග නිකුත් කිරීම. | 2023 ජනවාරි මස 31 දිනට පෙර |
| 10 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම. | 2023 පෙබරවාරි 15 දිනට පෙර |
| 11 | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම. | 2023 මාර්තු මස 31 දිනට පෙර |
| 12 | සේවා ස්ථානවලට මුදාහරින ලද, තම සේවා ස්ථානයට වාර්තා කරන ලද නිලධරයින් පිළිබඳ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීම. | 2023 අප්‍රේල් මස 30 දිනට පෙර |

ආකෘති පත්‍ර අංක 01

## ස්ථාන මාරු අයදුම්පත

(ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I, II සහ III ශ්‍රේණිවල නිලධාරීන් සඳහා)

"අ" කොටස

01. පෞද්ගලික තොරතුරු

1.1 නම (පත්වීම් ලිපියේ පරිදි) :.......................................................................................

1.2 නම වෙනස් කර ඇත්නම් එම නම මුලකුරු සමග : ..........................................................

1.3 සම්පූර්ණ නම :.......................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : .......................................................................................

1.5 උපන් දිනය : .......................................................................................

1.6 ස්ත්‍රී / පුරුෂ භාවය : .......................................................................................

1.7 පෞද්ගලික ලිපිනය : .......................................................................................

.......................................................................................

1.8 දුරකතන අංකය නිවස : ................................ ජංගම : ................................

1.9 විවාහක / අවිවාහක බව : .......................................................................................

1.9.1 කලත්‍රයාගේ නම : .......................................................................................

1.9.2 රැකියාව : .......................................................................................

1.9.3 සේවා ස්ථානය : .......................................................................................

1.9.4 දරුවන් පිළිබඳ විස්තර / දරුවන් පිළිබඳ තොරතුරු

| අංකය | දරුවන්ගේ නම | වයස | ඉගෙනුම ලබන පාසල් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

02. සේවා විස්තර

2.1 මුල් පත්වීම් දිනය : .......................................................................................

2.2 සේවා ශ්‍රේණිය : .......................................................................................

2.3 වර්තමාන ශ්‍රේණිය : .......................................................................................

2.4 වර්තමාන තනතුරු නාමය : .......................................................................................

2.5 එම තනතුරට පත්වූ දිනය : .......................................................................................

2.6 වර්තමාන සේවා ස්ථානය : .......................................................................................

2.7 කාර්යාලීය දුරකතන අංකය : .......................................................................................

2.8 2022.12.31 දිනට සේවා කාලය : අවු .............. මාස ............... දින ........................

03. ස්ථාන මාරු ඉල්ලීමට හේතු : .......................................................................................

පූර්ව සේවා ස්ථාන

| තනතුර | සේවා ස්ථානය | කාල සීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |

04. ස්ථාන මාරු ඉල්ලුම් කරන සේවා ස්ථාන

| අංක | තනතුර | සේවා ස්ථානය |
|---|---|---|
| | | |
| | | |
| | | |

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවට සහතික කරමි. මා විසින් ස්ථාන මාරු ලැබීමට ඉල්ලා ඇති ඕනෑම සේවා ස්ථානයකට / එම ස්ථානවලට ඉතා ආසන්න ස්ථානයකට ස්ථාන මාරු ලැබීමට කැමැත්ත මින් පළ කරන බවත් එම ඉල්ලීම මත, ලබා දෙන ස්ථාන මාරුව සඳහා නියෝග නිකුත් කළ පසු එම නියෝගය අවලංගු කිරීමට හිමිකමක් නොමැති බවත් පිළිගනිමි.

දිනය : .........................　　　　අත්සන: ...............................................

"ආ" කොටස

විදුහල්පති නිර්දේශය ( පාසල්වල සේවයේ නියුතු නිලධාරීන් සඳහා )

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,

ඉහත නම සඳහන් නිලධාරියාගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව/පසුව ලබා දීමේ පදනම මත නිර්දේශ කරමි.

දිනය : .........................　　　　අත්සන: ...............................................

(විදුහල්පති)

"ඇ" කොටස

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය

අතිරේක ලේකම්/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

මෙම නිලධාරියා සම්බන්ධයෙන් පසු ගිය වසර පහ තුළ විනය පරීක්ෂණ හා විගණන විමසුම් ඇත./නැත. ( තිබේ නම් තොරතුරු සඳහන් කරන්න.)

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

ඉහත නම සඳහන් නිලධාරියාගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව/පසුව ලබා දීමේ පදනම මත නිර්දේශ කරමි.

දිනය : .........................　　　　...............................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ / පෞද්ගලික ලිපි ගොනුව භාර ආයතනික මාණ්ඩලික නිලධාරියා හෝ ආයතන ප්‍රධානියා

## "ඇ "කොටස

<u>දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ නිර්දේශය</u>

අධ්‍යාපන ලේකම්,

(අ) නිලධාරියාගේ ඉල්ලීම නිර්දේශ කර ඉදිරිපත් කරමි.

(ආ) අනුප්‍රාප්තිකයෙක් සහිතව / රහිතව/පසුව ලබා දීමේ පදනම මත නිලධාරියා සේවයෙන් මුදා හැරිය හැකි බව නිර්දේශ කරමි.

(ඇ) පහත සඳහන් හේතු නිසා නිලධාරියා මෙම ආයතනයෙන් /පළාත් සභාවෙන් මුදා හැරිය නොහැකි බව දන්වමි.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

දිනය: ........................................ ..............................................................................................

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා /පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

ආකෘති පත්‍ර අංක 02

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ එක් එක් ශ්‍රේණි සඳහා වෙන වෙනම මෙම ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න.
(I, III , III ශ්‍රේණින් සඳහා)

අධ්‍යාපන අමාත්‍යාංශය /ජාතික පාසල් /මධ්‍යම රජය යටතේ පවතින ආයතනවල වසර 06 ට වඩා සේවය කළ නිලධාරීන්ගේ නාම ලේඛනය ............ වර්ෂය

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ පළාත් සභාව: ......................................................................
ප්‍රාදේශීය කාර්යාල / දිස්ත්‍රික්කය : ......................................................................
වැඩිම සේවා කාලයක් සහිත නිලධාරීන්ගේ නම් මුලින් ඇතුළත් කරන්න.

| අනු අංකය | නිලධාරියාගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය | පත්වීම් දිනය හා සේවා කාලය | තනතුර හා ශ්‍රේණිය | පෞද්ගලික ලිපිනය | උපන් දිනය හා 2022.12.31 දිනට වයස | පසුගිය වසර 5 තුළ නිලධාරියා සම්බන්ධව විනය හා විගණන විමසුම් ඇත/නැත | විවාහක අවිවාහක බව - කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා පාසල් යන දරුවන් සංඛ්‍යාව | | කලත්‍රයා ආරක්ෂක සේවයේ රාජකාරියේ නියුතු අයෙක්ද? | සේවා ස්ථාන සහ එම සේවා ස්ථානවල සේවා කාලය | මාරුවීම් ඉල්ලීමට හේතු | මාරුවීමට කැමති ස්ථාන | මාරු කමිටුවේ තීරණය (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | |

සියලුම නිලධාරීන්ගේ තොරතුරු මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ : නම : ...................................... අත්සන :................................ තනතුර :...................

පරීක්ෂා කළේ : නම :...................................... අත්සන : .............................. තනතුර :...................

දිනය : ..........................

..................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

ඇමුණුම් පත්‍ර අංක 03

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ එක් එක් ශ්‍රේණි සඳහා වෙන වෙනම මෙම ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න.
(I, II, III ශ්‍රේණීන් සඳහා)

පළාත් සභාවක් යටතේ ඇති ආයතනවල වසර 17ට වඩා සේවය කළ නිලධාරීන්ගේ නාම ලේඛනය............................වර්ෂය

පළාත් සභාව : ..................................................................

ප්‍රාදේශීය කාර්යාල / දිස්ත්‍රික්කය : ..................................................................

වැඩිම සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නම් මුලින්ම ඇතුළත් විය යුතු බව සලකන්න.

| අනු අංකය | නිලධාරියාගේ නම (මයා /මිය/මෙය යන්න සඳහන් කරන්න) | පත්වීම් දිනය | තනතුර හා ශ්‍රේණිය | ජාතික හැඳුනුම්පත් අංකය | දැනට පදිංචි ප්‍රදේශය හා ලිපිනය | උපන් දිනය හා 2022.12.31 දිනට වයස | පසුගිය වසර 5 තුළ නිලධාරියා සම්බන්ධව විනය හා විගණන විමසුම් ඇත/නැත | විවාහක අවිවාහක බව - . කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා බාලම ළමයාගේ වයස | | කලත්‍රයා ආරක්ෂක සේවයේ රාජකාරියේ නියුතු අයෙක්ද? | මුල් පත්වීමේ සිට සේවා ස්ථාන සහ කාලසීමාවන් | වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම් කර තිබේද?අයදුම්කර නොමැතිනම් ස්ථානමාරු ලැබුණහොත් සේවය කිරීමට කැමති ස්ථාන 3ක් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | |

සියලුම නිලධාරීන්ගේ තොරතුරු මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ : නම : ...................................... අත්සන :............:.................... තනතුර..................

පරීක්ෂා කළේ : නම :..................................... අත්සන :................................ තනතුර..................

දිනය : ..........................

...................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

ආකෘති පත්‍ර අංක 04

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථාන මාරුවීම් 2022/2023 - අභියාචනා පිළිබඳ ඉල්ලුම් පත්‍රය

අමාත්‍යාංශය :.....................................

දෙපාර්තමේන්තුව :.......................................

පළාත් සභාව : .....................................

ස්ථාන මාරුවීම් ලේඛනයේ අනන්‍යතා අංකය..............

**(අ). නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

01. නිලධාරියාගේ සම්පූර්ණ නම : (පැහැදිලි අකුරින්) ........................................................................................ ........................................................................................................................................................මයා/මිය/මෙය

1.1 මුලකුරු සමග නම: ............................................................................................................................

**1.2. ජාතික හැඳුනුම්පත් අංකය :.** ............................................................................................................

**1.3 ස්ථිර ලිපිනය:** ..................................................................................................................................

1.4 පදිංචි ස්ථානයේ ලිපිනය : ..................................................................................................................

1.5 2023 වර්ෂයේ පදිංචි ස්ථානය වෙනස් වන්නේ නම් නව පදිංචි ස්ථානයේ ලිපිනය : ............................. ..........................................................................................................................................................

02. ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය: ......................................................................................................

03. තනතුර හා ශ්‍රේණිය :.............................................................................................................................

3.1 සේවයට ඇතුළත් වූ දිනය : ...................................................................................................................

3.2 වර්තමාන ශ්‍රේණියට ඇතුළත් වූ දිනය:.......................................................................................................

04. උපන් දිනය: අවු .......... මාස...... දින........ 2022.12.31 දිනට වයස: අවු .............. මාස......... දින .......

05. සේවා විස්තර

| සේවා විස්තර | පත් වූ දිනය | සේවා ස්ථානය | සිට /දක්වා |
|---|---|---|---|
| .......................... | .................. | .................................... | ......................... |
| .......................... | .................. | .................................... | ......................... |
| .......................... | .................. | .................................... | ......................... |
| .......................... | .................. | .................................... | ......................... |

06. වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ අංකය :..........................................................................................

07. මා ඉල්ලා සිටිනුයේ ලබා දී, ඇති ස්ථාන මාරුවීම අවලංගු කිරීමටය / සංශෝධන කිරීමටය: ......................

08. අභියාචනා කිරීමට හේතු: (අදාළ හේතු සනාථ කිරීමට සහතික කරන ලද ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.)

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

09. ස්ථාන මාරුව සංශෝධන කළ යුතු/ ලබා දිය යුතු සේවා ස්ථාන :

අමාත්‍යාංශය:

............................................................................................................................................

දෙපාර්තමේන්තුව:

............................................................................................................................................

පාසල:

............................................................................................................................................

දිනය............................................ ..................................................

නිලධාරියාගේ අත්සන

**(ආ). දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිරීක්ෂණ :**

පෞද්ගලික ලිපි ගොනුව/ගොනු ගත තොරතුරු අනුව ඉහත විස්තර නිවැරදි වේ.

මෙම ස්ථාන මාරුව අවලංගු කිරිම / සංශෝධනය කිරිම සම්බන්ධයෙන් වන කරුණු දැක්වීම හා නිර්දේශය :

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

........................................ ..................................................................................................

දිනය

අමාත්‍යාංශ ලේකම් /දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

(අනවශ්‍ය වචන කපා හරින්න. සම්පූර්ණ තොරතුරු ඇතුළත් නොකළ අයදුම්පත් හා නිර්දේශ රහිත අයදුම්පත් අභියාචනා මණ්ඩලය විසින් සළකා බලනු නොලැබේ. වැඩි විස්තර ඇත්නම් පසුපිටේ සඳහන් කරන්න.)

අකාති අංක 05 A

## වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා

2023 වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම
අභියාචක පිළිබඳ තොරතුරු

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. මුලකුරු සමග නම:- | | | |
| 02. තනතුර හා පන්තිය:- | | | |
| 03. උපන් දිනය :-YYYY/MM/DD | 04. වයස :- (2022.12.31 දිනට) | 05. ජාතික හැඳුනුම් පත් අංකය:- | 06. ස්ත්‍රී/පුරුෂ භාවය:- |
| 07.ස්ථිර ලිපිනය :-<br><br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :<br>දිස්ත්‍රික්කය: | 08. තාවකාලික ලිපිනය:- | 09.දුරකතන අංකය<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- | |
| 10. විවාහක /අවිවාහක බව:- | 11. කලත්‍රයාගේ නම:- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:- | |
| 13. දරුවන් ගණන:- | 14. ඔවුන්ගේ වයස:- | 15. ඉගෙනුම ලබන පාසල් :- | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| 16. තනතුරට පත් වූ දිනය:- | |
| 17.වර්තමාන සේවා ස්ථානය :- | 18.සේවා ස්ථානය පිහිටි නගරය:- |
| 19.වර්තමාන සේවා ස්ථානයට වාර්තාකල දිනය:-<br>YYYY/MM/DD | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (2022.12.31 දිනට) අවු........... මාස........ දින....... |

| 21. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | | සේවා ස්ථානය | සේවා කාලය | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| | 1. | | | |
| | 2. | | | |
| | 3. | | | |
| | 4. | | | |
| | 5. | | | |
| | 6. | | | |

ආකෘති පත්‍ර අංක 09

**.................අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව/කලාප අධ්‍යාපන කාර්යාලය/ජාතික පාසල වෙතින්**
**ස්ථාන මාරු වී ගිය නිලධාරීන්**

සේවය: - ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය

| නම | ජාතික හැඳුනුම්පත් අංකය | ශ්‍රේණිය | මුදා හරින ලද දිනය | ආකෘති පත්‍ර අංක 06 අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා තිබේද? |
|---|---|---|---|---|
| | | | | |

...............................................................
දිනය

...............................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව